


# සත්ව කරුණාව සහ මානුෂික සංතෘප්තිය

සංතෘප්තිය බරපතළ සර්ව ව්‍යාප්ත පදයකි. සතුට - සැපත - යහපත - සුවසෙත - සාමය - මෛත්‍රිය - දයාව - කරුණාව - ඉවසීම - සැනසීම - චිත්ත විවේකය සහ විමුක්තිය යන විවිධාකාර මිනිස් සංවේදනා පමණක් නොව මනුෂ්‍ය සංහතියේ අනාගතය හා ප්‍රවර්ධනයද ඇතුළත් වන සුපිරි වහරකි. යෙදුමකි.

ධර්ම ද්වීපයක් තුළ පෙරාපු බෞද්ධයන් වූ දෙමාපියන්ට දාව උපන් අප වැනි ශ්‍රී ලාංකික ජනතාවකට අමුතුවෙන් කියා දුය යුතු මිනිස් ගුණයක් නොවන කරුණාව සකලවිධ සත්වයන් කෙරෙහි පතුරුවාලීම පුරුදු පුහුණු කරන ලද්දේ හය හතර දැනගත් අවදියේ පටන් ය.

"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා" යන බුදු වදන් නොදන්නා නොකියන කෙනෙක් අප ඉපදුණු කොදෙව්වේ නැත. තිරුපති වන්දනාවෙන් පටන් ගෙන - සිරි මහ බෝරදු - මල්වතු අස්ගිරි මහ නා හිමිවරුන් සමග ගංගාරාමාධිපති පොඩි හාමුදුරුවන් යන මේ සකලවිධ බලධාරීන්ගේ ආශිර්වාදය ලබාගෙන නිර්මල ථෙරවාදී බෞද්ධ ධර්මය සකල ලෝකවාසීන්ගේ හිතසුව පිණිස පතුරුවාලීමේ බරපතළ රාජකාරිය තමන් පිටම පටවාගෙන - අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරමින් සිරි ලක්දිව පුබුදුවා ලීමේ ජාතික මෙහෙවර ඉටුකරන අතිගරු උතුමාණන් වහන්සේගේ යහපාලනය යටතේ සුරසැප විඳින ශ්‍රී ලාංකික ජනතාව පමණක් නොව ශ්‍රී ලාංකික සත්ව ගණයාද කරුණාව යනු කුමක්දැයි අත්දැක ඇති බවද අපට සහතික ය.

අප වාසය කරන මේ මහ දූවේ පවතින සත්ව කරුණා මහිමය අපගේ ඇස් පනාපිට ම දිස්වන බොහෝ තැන් හා අවස්ථා ඇත. ඒ සුදු මුදු ගුණය වනාහි ලස්සන ඇඳුමක් අන්දාගෙන වඩා ගෙන බොහෝ සුරතල් සුනඛ පෝතකයා පෙර පාසලට අරන් යාමෙන් පටන් ගෙන මසට ගනු වස් නැවක පටවා යවනු ලැබූ ගව සම්පත ඝාතනය කිරීමෙහි ලා අනුගමනය කරනු ලබන අමානුෂික ක්‍රමවේද වලට එරෙහිව උද්ඝෝෂණ කිරීම සහ ඒ අනුව සම්බාධක පැනවීම දක්වා විහිදී යන ක්‍රියාවලියක් හෙවත් හැඟීම් සමුදායක් විසින් පිළිබිඹු කරනු ලබන්නකි. ඒ අප විසින්ම උරුමකර යවනා ලද අපගේ දෙවැනි මව්බිම වන මෙරට දක්නට ලැබෙන ආකාරයයි.

ශ්‍රී ලාංකික අපට නුහුරු දෙයකි බලු රේස් නම් වූ ජාතික ක්‍රීඩාව. අපට පුරුදු වූයේ බලු කපුටු දාන දීම පමණකි. ඒ දානයේත් උපරිම අවස්ථාව ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමි වූයේ සිරිලකට සිටි එකම සඟරජ හිමියන් වූ තුම්පනේ උපන් වැලිවිට සිරි සරණංකර මහ නා හිමියන්ටය.

සුද්දාගේ කාලයේ කොළඹ සහ නුවරඑළියේ දුවාපු අශ්ව රේස් තිබුණු බව අපට යන්තම් මතකය. බුද්ධ ජයන්ති උත්සවය පැවැත්වීමට වේදිකාව සාදන ලද පරණ රේස් පිටිය පසුව අස්ස විද්‍යාලයක් සඳහා පහසුකම් සලසන මධ්‍යස්ථානය

නැගී වටයක් දිවීම වරදක් විය නොහැකිය. මිනිසාගේ පරම මිතුරා වශයෙන් සම්මානයට පාත්‍ර වූ සුනඛයා අර වාගේ විනෝදයට සහ සූදුවට දිවවීම එසේ නොවේ. එය සතාට කරන හිංසාවකි. ඉන්දුනිසියාවේ ගව ඝාතන ක්‍රමවේදයට සමාන අකාරුණික ක්‍රියාවකි. මේ සත්‍යය අවබෝධ කරගත් එක් මහ ඇමති කෙනෙක් නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ සිටියි. මයික් බර්ඩ් නම් වූ ඒ උත්තමයා තමා යටතේ පවත්නා ප්‍රදේශය තුළ බලු රේස් පැවැත්වීම තහනම් කිරීමට නීති පැනවීම සිදු වූයේ විපක්ෂයේ - එනම කම්කරු පක්ෂයේ - විරෝධතා පවා නොතකා ය. නොබෝදා පවත්වන ලද පළාත්

මල් ඉසීම කවදා පටන් ගත්තාදැයි මම නොදනිමි. එසේ මල් කඩා ගෙන බුදු පුදට ගිය මා වැනි කී දෙනෙකුට ඒ දර්ශනය අමිහිරි වූවේ ද යන්න මට අනුමාන කළ හැකිය. එය ප්‍රස්තුතයට අදාල වන්නේ පාවාඩ මත ගමන් කරන හස්තියාට දෙන වදයයි. ඒ සතාට කතා කළ නොහැකිය. ඒ නිසා ඒ ආකාරයට



අලි හොරුද සිටිති. ප්‍රකට ධර්ම දේශක ධම්මාලෝක හිමි ඇතුළු තවත් අය සිටිති. ඉස්සර අප දැන සිටි අලි පෝසතුන් අතර බෙල්ලන්විල ලොකු හාමුදුරුවෝද සිටියහ. අලි අල්ලා වැඩ ගැනීම පරණ පුරුද්දක් වුවද එහි වරදක් දුටු එකද භික්ෂුවක් ගැන මා අසා නැත. එය අර බුදු වදනට ගැළපෙන නොගැළපෙන එක ගැන කියන කෙනෙක්ද නැත.

දෙහිවල සත්තුවත්ත අපට විනෝදයක් අධ්‍යාපනයක් ලද හැකි ප්‍රදර්ශනාගාරයක් විය. ඉස්සර එයටම යාබදව තිබුණු මින් මැදුරට ගොස් අසීමිත වින්දනයත් ලැබීමට අපේ දරුවෝ පුරුදුව සිටියහ. දැන් හෙට අනිද්දා එයත් අපට (යටත් පිරිසෙයින් දිවයිනේ වසන දරුවන්ට) අහිමිව යන පාටය.

ඒ සටන මෙහෙයවන සංවිධානයක් ශ්‍රී ලංකාව තුළ බිහිවී ඇත . සුප්‍රකට ව්‍යාපාරිකාවක බව ඔතාරා ගුණවර්ධනගේ මූලිකත්වයෙන් අරඹන ලද ඒ සංවිධානය දැනටමත් උද්ඝෝෂණයක් පටන් ගෙන ඇත. දෙහිවල සත්වෝද්‍යානය වසා එහි වසන සතා සීපාවුන් නිදහස් කරන ලෙසය ඔවුන් මෙහෙයවන ව්‍යාපාරයෙන් රටටත් රජයටත් කියා පාන්නේ.

අපට සත්ව කරුණාව කියා දුන් ගුරුවරු මහා සංඝ රත්නය පමණක් නොව මුලු ලොවටම ථෙරවාදී බෞද්ධ ධර්මයේ ආශිර්වාදය පතුරුවාලීමට කැසපට ගසාගත් ශ්‍රී ලාංකික ජනාධිපති උතුමාණන් වහන්සේ මේ පටන් ගෙන ඇති සාධාරණ උද්ඝෝෂණයට - ඉල්ලීමට - දක්වන ප්‍රතිචාරය - ක්‍රියාමාර්ගය දෙස අපි ඇස් ඇරගෙන බලා සිටිමු.

**<u>මහනුවර මහ පෙරහැර පිටත්වන ආකාරය බලා සිටි මගේ නෙත ගැටුණු දර්ශන දෙක තුනක් මතක් කළ යුතුය. දන්ත ධාතුව රැඳුණු කරඬුව රැගෙන පිටතට එන දිව නිලමේ ගමන් කරන පාවඩ මතට මල් ඉසීම කවදා පටන් ගත්තාදැයි මම නොදනිමි. එසේ මල් කඩා ගෙන බුදු පුදට ගිය මා වැනි කී දෙනෙකුට ඒ දර්ශනය අමිහිරි වූවේ ද යන්න මට අනුමාන කළ හැකිය.</u>**

වූයේ අප කොළඹ සරසවියෙන් පටන් ගෙන පේරාදෙණියෙන් පිට වී රාජකාරි කිරීමට පටන් ගත්තාටත් පසුවය.

අපට පුරුදුව තිබුණු දැන් අභාවයට ගොස් ඇති බවට අනුමාන කළ හැකි සූදුවක් විය. ඒ කුකුලන් පොර කෙටවීමය. මෙරට අශ්ව රේස් ගැන කිසිවක් කතා කරන කෙනෙක් නැත. එහෙම කළහොත් - රටම උද්දාමයෙන් සලකන - වික්ටෝරියාව ඇතුළු ප්‍රාන්ත කිහිපයකම නිවාඩු දිනයක් වන මෙල්බර්න් කුසලාන සඳහා පෙරපර දෙසින්ම අශ්වයන් මෙහි කැඳවා ඒම ද නවතිනු ඇත. ලොව බොහෝ රටවල ජනතාව ලබන විනෝදය සහ ලාබද වළක්වාලීමක් ඒ රේස් තහනම් කිරීමෙන් සිදු වන්නේය. බාධක සහිත රේස් දිවීම සම්බන්ධයෙන් නම් වරින් වර විරෝධතා පළ වනු දක්නට ලැබෙයි. එහෙත් තවම අත්හළ පාටක් නැත .

අසුන් පිට යාම හොඳ නම් විනෝදයට උන් පිට

පාලන ආයතන ඡන්ද විමසීමේදී ලිබරල් පක්ෂයට අන්ත පරාජයක් හිමි වූයේ එකී නීතිය නිසා බව දැන් විපක්ෂ නායකයා පමණක් නොව ලිබරල් පාක්ෂිකයෝද පිළිගනිති.

විපක්ෂයේ විරෝධයට සාධාරණ පදනමක් ද ඇත. ඒ කර්මාන්තයේ යෙදෙන සේවක පිරිසට රැකියා අහිමිවීම ඔවුන් අතට පත් හොඳම තුරුම්පුවය.

දැන් අපි අපේ දේශය දෙසට හැරෙමු. අපට කරුණාව ක්‍රියාවෙන්ම ප්‍රදර්ශනය කරන ආකාරය දෙස නෙත් යොමු කරමු. නගරයක් පාසා ගව මස් කෑමට විරෝධය පාමින් පවත්වන ලද පෙරහැර ඔබට මතක නැතුවාද ඇත. එයින් වැඩි හරියක් සංවිධානය කරන ලද්දේ නම් දැරූ හරක් හොරුන් බවද ප්‍රකට රහසක් විය. එයට හේතුව මස්කඩ වැසූ විට වාසිය තමන්ට බව හරක් හොරු දැන සිටීමයි. හොඳම නිදසුන හපුතලේ නගර සභාව තුළ සිදු වූ ජාවාරමෙන් පෙනී ගියේ ය. සුපිරි බෞද්ධයකු වූ විජමු ලොකුබණ්ඩාර ඇමති ධුරයක් දරන අවදියේ හපුතලේ නගර සභාවේ සභාපති ධුරය හිමිව සිටියේ ඔහුගේ සහෝදරයා ය. ඔහුගේ නියමය පරිදි හපුතලේ නගරය තුළ තිබුණු මස්කඩ වසා දමන ලදී. හරක් මස් කන අයට ලාබෙට මස් සපයන හොර කඩ නගරය පුරාම මතුවීම එහි ආනිශංසය විය.

මෙවර කැළණියේ දුරුතු මහ පෙරහැරේ ගිය ඇතකු කුලප්පු වීම නිසා හටගත් කලබලය ඔබට රූපවාහිනියෙන් දැක ගැනීමට ලැබෙන්නට ඇත. මහනුවර මහ පෙරහැර පිටත්වන ආකාරය බලා සිටි මගේ නෙත ගැටුණු දර්ශන දෙක තුනක් මතක් කළ යුතුය. දන්ත ධාතුව රැඳුණු කරඬුව රැගෙන පිටතට එන දිව නිලමේ ගමන් කරන පාවඩ මතට

හීලෑ කරගෙන පෙරහැරක අරන් යන එක තමාට කෙබඳු පීඩාවක්ද යන්න කීමට විදියක් නැත. මේ රටේ සත්ව කරුණාව දේසනා කරන අහිංසාවාදීන්ට එය අරුචි වීමටද ඉඩ ඇත .

අලි - ඇත් - පුවතට එක් කරන ලද නවතම ජවනිකාව හොර අලි ජාවාරමය. එතැනත් සිවුරු දැරූ

## Land for Sale
**Gampaha**

Quiet residential area in 47 Perches of land
with a old house off Church Road.
7 minutes to town.

Valued only for land Rs. 700,000 per Perch .

call : 0435879888 or
email : wskper56@gmail.com